# යඤ්ඤ සූත්‍රය හා පඤ්ච යාග

ආධුනික කථිකාචාර්ය වැලිවිට සෝරත හිමි

**ආරම්භයඃ-**

පසේනදි කොසොල් මහරජතුමා අරභයා දේශනා කළ හා ඔහු පිළිබඳ තොරතුරු සඳහන් වන සූත්‍ර අන්තර්ගත වී ඇත්තේ සංයුත්ත නිකායේ කෝසල සංයුත්තයේය. සාමාන්‍යයෙන් කොසොල් මහ රජතුමා තමාට සුළු කාරණාවක් සම්බන්ධයෙන් හෝ ගැටළුවක් ඇතිවුවහොත් වහාම බුදුරජුන් වෙත එළඹ ඒ පිළිබඳ විමසීම සිරිතක් විය. එසේ බුදුරජුන් වෙත පැමිණ ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු ලෙස දේශනා කළ සූත්‍ර මෙහි අඩංගු වී ඇත. එසේම නොයෙක් අවස්ථාවන්වලදී කොසොල් මහරජතුමා සම්බන්ධයෙන් සිදු වූ සිදුවීම් අලලා දේශනා කරන ලද සූත්‍ර ද මෙහි දැකිය හැකිය. එවැනි එක් සූත්‍රයක් ලෙස ''යඤ්ඤ සූත්‍රය'' පෙන්වා දිය හැකිය. මෙහි විස්තර වන්නේ කොසොල් මහ රජතුමා විසින් සිදු කරන ලද යාගයක් පිළිබඳ තොරතුරුය. ඔහු විසින් එම යාගය පැවැත්වීම සඳහා දැසි - දස්, කම් - කරුවන්ගේ අනුග්‍රහයෙන් ගොන්නු පන්සියයක්, නාම්බෝ පන්සියයක්, නැහැඹියෝ පන්සියයක්, එළුවෝ පන්සියයක්, බැටළුවෝ පන්සියයක් ආදි වශයෙන් සත්තු විශාල ප්‍රමාණයක් යාග ස්ථම්භය වෙත ගෙන යන ලදි. සියලු දාසයෝ රජුගේ නියෝගය ඉවත දැමිය නොහැකි නිසා, ඔහුගෙන් දඬුවම් ලැබේය යන බියෙන්, කඳුලු වැටුණු මුහුණු ඇතිව හඬමින් අවශ්‍ය කටයුතු සිදු කළහ. මේ කාරණය පෙරවරු කාලයේ පිණ්ඩපාතයේ වැඩි භික්ෂූන් වහන්සේලා දැක සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකී සිට බුදුරජුන් හමුවට ගොස් සැළ කර සිටියහ. ඒ බව දත් බුදුරජාණන් වහන්සේ යඤ්ඤ සූත්‍රයේ ඇතුළත් පංච යාගයක් පිළිබඳ කරුණු පෙන්වා දෙමින් මෙම ''යඤ්ඤ සූත්‍රය'' දේශනා කළ සේක.

**යාගයෙහි ඉතිහාසයඃ-**

භාරතයේ වයඹ දිග දේශයට සංක්‍රමණය වූ ඉන්දු යුරෝපීයයන් වූ ආර්යයන්ගේ පැමිණීමත් සමග යාග ක්‍රමය ද ආරම්භ වන්නට විය. වෛදික බ්‍රාහ්මණයන් ලෙස උසස් මට්ටමෙහි ලා සැලකූ ඔවුන්ගේ ආගමික පිළිවෙත වූයේ කර්ම මාර්ගයයි. භාරතීය ආගමික හා දාර්ශනික ඉතිහාසයෙහි වේද මන්ත්‍ර යුගයේ ඇරඹී මෙම කර්ම මාර්ගය බමුණු පූජකයන්ගේ මූලිකත්වයෙන් ගොඩනැගෙන්නට විය. ඍග් වේදයේ යාග කර්මය සඳහා උසස් තැනක් හිමි වී තිබුණු බව ''මුළු ලොවම එකම යාග කර්මයකි''[1] යන ප්‍රකාශයෙන් පැහැදිලි වේ. යාග පැවැත්වීම හදිසියේ ආකස්මිකව පහළ වූ ආගමික ප්‍රතිඵලයක් නොවේ. වෛදික යුගයේ සිට ක්‍රමයෙන් පැවතෙමින් ප්‍රබලව නැගී ආ ආගමික ක්‍රියා මාර්ගයක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

චතුර්වේදය පදනම් කරගෙන පැරණි භාරතීයයන් ඉදිරිපත් කළ මෙම යාග ක්‍රමය තුළින් ඔවුන් බලාපොරොත්තු වූයේ ඔවුන්ගේ පරම නිෂ්ඨාව වූ ''බ්‍රහ්ම සහව්‍යතාවයයි.'' එනම් සර්ව බලධාරී බ්‍රහ්මන්ගේ ආත්මය සමග ඒකත්වයට පැමිණීමයි. දෙවියන් සඳහා යාග නොකරන්නෙකුට කිසිදිනෙක බ්‍රහ්ම සහව්‍යත්වයට පත්විය නො හැකිය. යාග කිරීම මෙලොව හා පරලොව උභයාර්ථ සිද්ධිය ඇති කරවන්නක් බව ඒත්තු ගැන්වීමට බමුණු සමාජය විසින් නොයෙක් කරුණු කාරණා ඉදිරිපත් කරන්නට විය. වෛදික ආර්යයන් අතර වඩාත් සැලකිල්ලට භාජනය වූ දෙවියන් දෙදෙනෙක් වූයේ ''ඉන්ද්‍ර'' හා ''වරුණය.'' එයිනුත් ආර්ය සෙබළාගේ යුද දේවතාවා වූයේ ඉන්ද්‍රය. ඉන්ද්‍ර කාලගුණය පිළිබඳ දේවතාවා ද, අකුණු, කුණාටු හා මේඝ ගර්ජන පිළිබඳ අධිපතියා ද විය. ඔහුගේ අතෙහි වූයේ වජ්‍රායුධයකි.[2] ඉන්ද්‍ර වෙනුවෙන් ඍග් වේදයෙහි වෙන් වී ඇති ගීතිකා සමූහය දෙස බැලීමෙන් පෙනී යන්නේ ඔහු වෛදික ආර්යයන් අතර තෙරම් ගරු සම්භාවනාවට පාත්‍ර වූ දෙවියෙක් ද යන වගයි. වැදගත්කමින් ඉන්ද්‍රට පමණක් දෙවෙනි වූ වරුණ දෙවියා ඉරානයට ගිය ආර්යයන්ගේ ප්‍රධාන දෙවියා බවට පත්විය. මොවුන් දෙපිරිස එක්ව සිටි කාලයේ මේ දෙවිවරු දෙදෙනාම එකට ඇදවූවාහුය. සදාචාර ධර්මය භාරව සිටියේ

වරුණ දෙවියාය. ඔහු මිනිසුන් කරන හොඳ නරක ක්‍රියාවන් පිළිබඳ විමසිල්ලෙන් සිටි අතර නරක කරන පුද්ගලයාට ඔහුගෙන් සමාවක් නොවීය. එමනිසා භක්තිමත්හු ඔහු කෙරෙහි දැඩි භය පක්ෂපාතීත්වක් දැක්වූහ. ඍතු සම්බන්ධයෙන් භාරකරු වූයේ ද මොහුය.[3]

යාගයේ අරමුණ බ්‍රහ්මසහව්‍යතාවය වුවත් ලෞකික වශයෙන් ලබාගත හැකි අරමුණු කිහිපයක් පදනම් කරගෙන ද යාග පැවැත්වීම සිදු කෙරිණි. පුතුන් ලබා ගැනීම, කෙත්වතු සරුසාර කර ගැනීම, රෝගාබාධ සමනය කිරීම, සතුරන් මර්දනය කොට සිය බලය වැඩිකර ගැනීමට හැකිවීම, ආදි අරමුණු යාග කර්මයක් තුළින් ඉටුකරගත හැකි බව සැලකිත. එසේම මව්කුස පිළිසිඳ ගැනීම, බිහිවීම, රන්කිරි කට ගෑම, උපන් දරුවන්ගේ කෙස් කැපීම, අකුරු කීම, ඉඳුල් කටගෑම, ආවාහ විවාහය වැනි වැදගත් අවස්ථාවන්වලදී ඔවුන්ට ආරක්ෂාවත්, සෞභාග්‍යයත් ලැබෙන බව ප්‍රකාශ කරමින් යාග හෝම පැවැත්වීම සිදු කෙරිණ. මේ සෑම අවස්ථාවක දී ම යාගය පවත්වා මහා බ්‍රහ්මයාගේ ආශිර්වාදය ලබා ගනී. එසේ නොකරන්නේ නම් සර්ව බලධාරී මහා බ්‍රහ්මන් කෝපවන බවත් එයින් එම පුද්ගලයාගේ සියලු දේ නැතිකොට ඔහුට කරදර උපද්‍රව ඇති කරන බවත් උගන්වා ඇත.

බුදුරජාණන් වහන්සේ ලොව පහළවන යුගයේ සමාජයේ උසස් යැයි සම්මතව සිටියේ බමුණන්ය. ඔවුන් කවර අන්දමේ අකටයුත්තක් කළ ද, දුරාචාරව හැසිරුණ ද ඒ පිළිබඳ ව විමසීමට කිසිවෙකුටත් අයිතියක් තිබුණේ නැත. තම අනුගාමිකයන්ට පැවසුවේ කළ වරදට මෙන් ම නොදැන සිදුවන පාපයනට දඬුවම් විඳ එයින් සමනය විය හැකි බවය. යාග පැවැත්වීම තුළින් දෙවියන් සතුටු කළ යුතු බවත් ඉන් බ්‍රහ්ම සහව්‍යත්වයට පත්වීමට හැකි බවත් පෙන්වා දුන්හ. උසස් හා උගත් බ්‍රාහ්මණයන්ගේ එවැනි වදන් විශ්වාස කළ බොහෝ පිරිස් විවිධ යාග ක්‍රම පවත්වන්නට වූහ. මේ නිසා සාමාන්‍ය පුද්ගලයාගේ පටන් රාජ්‍ය තාන්ත්‍රික පිරිස් දක්වා උපදෙස් දීමට බ්‍රාහ්මණයින්ට බලය පැවතුණි. රජ කෙනෙකුට ඇතිවන ඕනෑම ගැටළුවක දී පවා ඔහුට උපදෙස් දෙමින් යාග හෝම පැවැත්වීමට විධි විධාන සකස් කරන ලද්දේ මේ නිසාය. වරක් කොසොල් මහරජු දුටු සිහින 16 පිළිබඳ පුවත සැලවීමෙන් පසු රාජ සභාවේ සිටි උසස් බමුණන්ගේ උපදේශය වූයේ ''සප්ත සතික'' යාගයක් පැවැත්විය යුතු බවය. එහෙත් මල්ලිකා දේවියගේ මඟ පෙන්වීම මත භීෂණකාරී හා හිංසනකාරී යාගයෙහි පැවැත්වීම නතර විය. මෙම යාගය පිළිබඳ විස්තරයක් දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ එන තොරතුරුවලින් පැහැදිලි කරගත හැකිය. එහි සඳහන් වන අන්දමට

''තෙන ඛො පන සමයෙන කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහා යඤ්ඤො උපට්ඨිතො හොති. සත්ත ච උසභසතානි, සත්ත ච වච්ඡතරසතානි, සත්ත ච වච්ඡතරීසතානි, සත්ත ච අජසතානි, සත්ත ච උරබ්භසතානි ථූනූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය.''[4]

යනුවෙන් කූටදන්ත බමුණාට යාගයක් පැමිණි අතර ඒ සඳහා සතුන් හත්සියය බැගින් තෝරාගෙන ඇත. පෙළෙහි සඳහන් තොරතුරුවලට අනුව ගවයන්, වස්සන්, වැස්සියන්, එළුවන්, බැටළුවන් පමණක් මෙම යාගය සඳහා යොදාගෙන ඇත. එහෙත් අට්ඨකථාවේ සඳහන් අන්දමට මෙකී සතුන්ට අමතරව සත්සියය බැගින් මෘගයන් ද, පක්ෂීන් ද යොදාගෙන ඇති බව පෙනේ.

''එතෙ තාව පාළියං ආගතායෙව, පාළියං පන අනාගතානම්පි අනෙකෙසං මිග පක්ඛීනං සත්ත සත්තසතානි යම්පිණ්ඩිතානෙවාති වෙදිතබ්බාති, සබ්බසතික යාගං නිරයෙ යජිතුකාමො හොති.''[5]

මෙවැනි යාගයක් කොසොල් මහරජතුමා විසින් සිදු කරන ලද්දේ නම් ඉන් මහ විනාශයක් සිදුවන බව දුටු මල්ලිකා දේවිය මෙකී සිහින පිළිබඳ බුදුරජුන්ගෙන් විචාරණ මෙන් ඉල්ලා සිටියාය. ඒ අනුව කොසොල් මහ රජතුමා බුදුරජුන් වෙත පැමිණ කරුණු සියල්ල පවසා යාගය පැවැත්වීම නවතා දමා ඊට පිළියම් නියමාකාරයෙන් සිදු කළේය.

මෙසේ බමුණු සමාජය උසස් මට්ටමක පැවතුණු නිසා බමුණන් නිසා වේදයත්, වේදය නිසා බමුණෝත්, මේ දෙයාකාර සම්බන්ධය නිසා යාගයත් ඇති වී ඒකාබද්ධ වූ පුදසිරිත් මාලාවකින් සන්නද්ධ

වූහ. බමුණු බලය ප්‍රබලත්වයට පැමිණීමත් සමග යාග හෝම පැවැත්වීමේ දී ද මොවුන්ගේ මූලිකත්වය ද ප්‍රබල සාධකයක් විය. ඊට හේතු වූයේ යාගය ඉතා පිරිසිදුව හා අංග සම්පූර්ණව සිදුකළ යුතු වූ නිසාය. කෙතරම් උසස් ලෙස යාග උපකරණ තිබුණේ වී නමුත් බ්‍රාහ්මණ පූජකයන් නොමැතිව සිදු කරන යාගය සඳහා මහා බ්‍රහ්මයා නොපැමිණෙන බවත් ඔහු ඉන් සතුටට පත් නොවන බවත් යාග කාරකයන්ගේ විශ්වාසය විය. එමනිසා යාග පැවැත්වීමේ දී යාගය කළයුතු පිළිවෙල හා යාගය කරන අයුරු පෙන්වා දීම සඳහා ප්‍රබල බ්‍රාහ්මණ පිරිසක් සිටියහ. ඔවුන් වර්ග වශයෙන් සතරාකාරය.[6]

1. හොතෘ - ඍග් වේදය භාර තැනැත්තාය. ඍග් වේද පාඨ කියමින් දෙවියන්ට යාගය සඳහා ආරාධනා කරන පූජකවරයා
2. අධ්වර්යු - යජුර් වේදය භාර මොහු එහි නියමයන් පරිදි ඊට අයත් වේද පාඨ කියමින් යාගය පවත්වන පූජකයා
3. උද්ගාතෘ - සාම වේදය භාර මොහු දෙවියන් සතුටු වන ආකාරයෙන් සාම වේද පාඨ ගායනා කරන පූජකයා
4. යඤ්ඤකාරක - අථර්ව වේදයට අධිපති මොහු කිසිදු අඩුපාඩුවකින් තොරව හරි වැරදි බලමින් යාගය අධීක්ෂණය කරන පූජකයා. මොහු තමාට අයත් වේදයෙහි පමණක් නොව අනිත් වේද තුනෙහි ද මනා දැනුමක් ඇත්තෙක් විය යුතු විය.

යාගය පැවැත්වීමේදී ඊට අවශ්‍ය උපකරණ වූයේ යන්ත්‍ර මන්ත්‍ර, යාග පවත්වන විධි පිළිබඳ සඳහන් ක්‍රමවේද, යාගය පවත්වන ස්ථානය වූ යාගස්ථම්භය හා යාගය සඳහා යොදාගන්නා වූ සත්වයන් ආදියයි. එසේම යාගය සඳහා ප්‍රධාන වූයේ ගින්නයි. ගිනි වර්ග තුනක් ඇත. එනම්:- ගාර්හස්පත්‍යය, ආහවනීය හා දක්ෂිණා යන ඒවාය. ගාර්හස්පත්‍යය යනු යජමාන හෙවත් යාගය කරන්නා විසින් නොනිවා පවත්වාගෙන යනු ලබන ගින්නය. හතරැස් ආකාරයකින් ඉදිකොට සකස් කර ගන්නා ලද ගින්න ආහවනීය නම් වේ. අඩ සඳක ආකාරයකින් ගාර්හස්පත්‍යය ගින්නට දකුණු දෙසින් දල්වන ගින්න දක්ෂිණා ගින්න නම් වේ. මෙහිදී යාගය කරවන පුද්ගලයා ''යජමානක'' වශයෙන් හඳුන්වයි. ඔහු විසින් යාගය සිදු කරන පූජක බමුණාට බොහෝ තෑගි බෝග ලබාදිය යුතුය. එසේ නොදෙන්නේ නම් පූජකයාට යාගය කරවන පුද්ගලයාට විපතක් පැමිණවීමේ බලය ඇත. මෙසේ නොයෙක් උපකරණ ආශ්‍රයෙන් සිදු කරනු ලබන යාග විධි රාශියක් දක්නට ලැබේ.[7]

1. දර්ශ පූර්ණ මාස්‍ය යාගය - පසළොස්වක හා අමාවක දිනයන්හි පවත්වන යාගය
2. අග්නි හෝත්‍ර යාගය - දෛනිකව පවත්වන යාගය
3. චතුර් මාස්‍ය යාගය - සිව් මසකට වරක් පවත්වන යාගය.
4. සෝම යාගය - නොකඩවා දින කිහිපයක් කරන යාගය
5. රාජසූය යාගය - රජුන් අභිෂේක කරන දිනයේ කරන යාගය
6. අග්නි චයන යාගය - නොකඩවා වර්ෂයක් සිදු කරන යාගය
7. සේද්‍රත්‍රමනි යාගය - මද්‍යපාන වර්ගාදිය ගෙන කරන යාගය
8. අශ්වමේධ යාගය - බලවත් රජුන් විසින් අසුන් බිලි දෙමින් සිදුකරන යාගය
9. පුරුෂමේධ යාගය - පිරිමින් 184 දෙනෙකු බිලි දෙමින කරන යාගය
10. සර්ව මේධ යාගය - සියල්ල පුද දෙමින් සිදු කරන යාගය
11. සම්මාපාස යාගය - සතුන් බිලි නොදෙමින් උපකරණ සහිත යාගස්ථම්භ ගෙනගොස් සරස්වතී නදියේ ගිලෙමින් සිදු කරන යාගය.
12. වාජපෙය්‍ය යාගය - යාගස්ථම්භවල ගවයන් බැඳ උන්ගේ ලෙයින් පූජා පවත්වා ජපකරන ලද ගිතෙල් පානය කරමින් කරන යාගය
13. නිරග්ගල යාගය - සතුන් හා යාග ද්‍රව්‍ය රැස්කොට සතුන් මරා පුදා බමුණන්ට දන් දී සිදු කරන යාගය

මෙයින් ඇතැම් යාග පිළිබඳ තොරතුරු බෞද්ධ සූත්‍රවල හා අටුවාවන්හි දැකගත හැකිය.[8] බොහෝමයක් යාග විශාල සතුන් ප්‍රමාණයක් මරා කෙරුණු යාග වූ බැවින් ඒවා රජවරුන්ට පමණක් සිදු

කළ හැකිවිය. අන් සියලු දෙනාට ඒ සඳහා අනුග්‍රහය දැක්වීමට හා සහභාගි වීමට අවකාශ ලැබුණි. එහෙත් යාගස්ථම්භය සමීපයට යා හැකි වූයේ ඉන් සමහරෙකුට පමණි.

**යඤ්ඤ සූත්‍රයේ සඳහන් පඤ්ච යාග**

මෙම යාග වර්ග අතරින් කෝසල සංයුත්තයේ යඤ්ඤ සූත්‍රයේ සඳහන් වන්නේ යාග ක්‍රම පහක් පිලිබඳව පමණි. එනම්:- අස්සමේධ, පුරුෂමේධ, සම්මාපාස, වාජපෙය්‍ය හා නිරග්ගල යාගය යන යාග ක්‍රම පහ පමනි. මෙම යාග විධි පහ අතරින් ඇතැම් යාග බ්‍රාහ්මණයින් විසින් නොයෙක් සත්වයන්ට හිංසා පීඩා පමුණුවමින් සිදුකරන යාග හැටියට කරන ලදි. එහෙත් මීට පෙර මෙම යාග වර්ග පහ යහපත් අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සිදු කළ යාග වර්ග පහක් බව බුදුරජුන් විසින් පෙන්වා දෙන ලදි. එය දාන වර්ග පහක් වශයෙන් ව්‍යවහාර කෙරුණු බව ද, එම පංචවිධ දාන ක්‍රමය මෙකී යාග පැවැත්වීමට පෙර රජවරුන් විසින් සිදු කරන ලද්දක් බව ද පෙන්වා දී ඇත. එවැනි යාගයන්වල දී සත්වයන්ට දෙනු ලබන රුදුරු හිංසාකාරි බවින් ඈත්කොට රටක ආර්ථික සමෘද්ධියට හා ශිෂ්ට සම්පන්න ජනතාවකට සහභාගි විය හැකි එකී දානය නව සමාජ ක්‍රමයක් ඇති කිරීමට ඉවහල් විය. එම දාන වර්ග පහ මෙසේ වර්ගීකරණය කර දැක්විය හැකිය.

1. අශ්වමේධ යාගය - සස්සමේධ දානය - (සස්ස- ධාන්‍ය)
   ''ධාන්‍ය'' සම්පාදනයට අවශ්‍ය ගොවි උපකරණ හා මිල මුදල් සපයා දෙමින් ගොවියාට සෙත සැලසීම
2. පුරුෂමේධ යාගය - පුරිසමේධ දානය (පුරුෂ බලය)
   ''පුරුෂ බල'' ඇති අයට නිසි පරිදි බත් වැටුප් ආදිය ප්‍රදානය කොට ඔවුන්ගේ සිත්ගෙන රටෙහි ආර්ථික සමෘද්ධියට දායක කරවීම
3. සම්‍යක්පාස යාගය - සම්මාපාස දානය (මනා පාසය)
   දිළිඳු අසරණ මිනිසුන්ට කිසිදු ලියවිල්ලක් හෝ පොලියක් නොගෙන දහස් ගණන් දී ''හිත පාසයකින්'' මෙන් බැඳගෙන ජනතා සහයෝගය ලබා ගැනීම
4. වාජපෙය්‍ය යාගය - වාචපේය දානය (ප්‍රිය වචනය)
   මුදු මොළොක් ''ප්‍රිය වචනයෙන්'' මිනිසුන්ගේ හිත බැඳ ගනිමින් අන්‍යෝන්‍ය සහජීවනය සැලසීම
5. නිරග්ගල යාගය - නි - අග්ගල දානය (අගුලු නැති)
   මෙකී සිව් වැදෑරුම් ධාර්මික දානයන් නිසි ලෙස ඉටු කිරීමේ දී සොර සතුරු බිය පහව ගොස් ''දොර අගුලු නොමැතිව'' විසීමට හැකිවන පරිදි පරිසරයක් ගොඩ නැගීම

**1. අස්සමේධ යාගය**

මහායාගයක් වූ අස්සමේධ යාගය පැවැත්වීමට කිසිදාක සාමාන්‍ය මිනිසෙකුට කළ නොහැකි විය. එය පැවැතවූයේ ඓශ්වර්යයෙන් ද බලයෙන් ද යුක්ත වූ රජෙකුගේ අනුග්‍රහයෙනි. මෙවැනි යාගයක් කළ රජ කෙනෙකු හඳුන්වා දෙනවිට ''මොහු අශ්වමේධ යාගය කළ රජ කෙනෙකැයි'' කියූ පමණින් ඒ රජු පිළිබඳ කළ හැකි උසස්ම වර්ණනාව එය විය.[9] අශ්වමේධ යාග සියයක් කරන රජ කෙනෙකුට ඉන්ද්‍ර දෙවියා පවා පරදවා මුළු සක්වළෙහි ම අණසක පැතිරවිය හැකි බව බමුණු පූජකයෝ රජවරුන්ට ඉගැන්වූහ. එහෙත් එවැනි ක්‍රියාවක් සිදු කිරීමට එක් රජ කෙනෙකුට වර්ෂ සියයක් ගත වේ. ඊට හේතුව නම් මෙම යාගය වර්ෂයක් පුරා පැවැත්විය යුතු වූ එකක් වන නිසා හා ඒ සඳහා අවම වශයෙන් වර්ෂ දෙකක්වත් සූදානම් වියයතු වූ නිසාය. ඇතැම් ග්‍රන්ථයකට අනුව අශ්වමේධ යාගය පැවැත්වීම සඳහා සතුන් 609 ක් යොදා ගනී. (හීලෑ සතුන් 327 ක් හා කැලෑ සතුන් 282 ක් වශයෙනි.)[10] සංයුත්ත නිකාය අටුවාවේ සඳහන් වන්නේ හීලෑ අශ්වයින් 327 දෙනෙක් ද, කැලෑ අශ්වයින් 22 ක් ද, ආරණ්‍යයෙහි වෙනත් සතුන් 260 දෙනෙක් ද වශයෙන් සතුන් 609 ක් තෝරා ගන්නා බවය.[11]

රජ පෙළපත අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පුතුන් ලබා ගැනීම, රජුට සියලු යස ඉසුරු ලබා ගැනීම. සියලු අදහස් මුදුන්පත් කර ගැනීම, බල ප්‍රතාප වර්ධනය කර ගැනීම ආදිය යාගය පැවැත්වීමේ පරමාර්ථ විය. ප්‍රධාන යාගය සඳහා යොදා ගැනෙන්නේ දවස් තුනක් පමණි. එහෙත් සුළු සුළු යාග විධි සිදු කොට අවුරුද්දක් පුරා ගිනි දෙවියා පුදමින් ගීතිකා ගායනා කරමින් යාගය පැවැත්වීම සිදු කරයි. යාගය සඳහා තෝරාගනු ලබන ප්‍රධාන අශ්වයාගේ පූර්ව භාගය කළු පැහැ සහ උත්තර භාගය සුදු පැහැ විය යුතුය. යාග භූමියෙහි සිටුවා පහත් කුලයක මිනිසෙකු ලවා සුනඛයෙක් මරා ඒ සුනඛයාගේ මළ සිරුර අශ්වයාගේ පා අතරට දමයි. (මෙසේ සිදු කරන්නේ යක්ෂ දිෂ්ටි හා භූත දෝෂ විනාශ කිරීම හෝ දීර්ඝ මාර්ගයකට අවතීර්ණ වන අශ්වයාට ආරක්ෂාව සපයා දීම සඳහා යැයි මහාචාර්ය ඕල්ඩන් බර්ග් මහතා පවසයි.)[12] මින්පසු පුදපූජා කිහිපයක් පවත්වා අශ්වයා මහළු අශ්වයන් සියයක් සමග නිදැල්ලේ යාමට ඉඩහරියි. එහෙත් ඒ අශ්වයා පිටුපස කුමාරවරු සියයක් ද,[13] කුලීනයන් සියයක් ද, දුනුදිය දැරූ රියදුරන් සියයක් ද, මුගුරු දැරූ මිනිසුන් සියයක් ද, ගමන් කරති. මෙසේ සිදුකරන්නේ එකී අශ්වයාට වන අනතුරු වළක්වාලීම සඳහා ය. අශ්වයා ගමන් ගන්නා සෑම ප්‍රදේශයක් ම යාගය පවත්වන රජුට යටත්විය යුතු බව සලකන ලදි. යම් කෙනෙක් එයට විරුද්ධ වන්නේ නම් යාගය පවත්වන රජුට කරන අභියෝගයක් සේ සැලකේ. චක්‍රවර්ති රජකෙනෙක් අභිෂේක කිරීමේ දී ද සත්ත රත්නයෝ පහළ වෙති. ඉන් එක් රත්නයක් නම් චක්‍රරත්නයයි. චක්‍රරත්නය පහළ වූ පසු දින හතක් ඒ ඒ දිශාවන්හි පෙරළෙයි. සිව්මහා සාගරය කෙළවර කොට ඇති සතර දිශාවෙහි පෙරලී නැවත අභිෂේක කළ ස්ථානයට ම පැමිණ අලවංගුවක් ගැසුවාක් මෙන් සිටියි. යම් හෙයකින් චක්‍රරත්නය පෙරළුන දිශාවක යම් රජ කෙනෙක් රජුට පක්ෂපාති නොවුයේ නම් ඔහු සමග යුදකොට එම රාජ්‍යය අල්ලා ගැනීම සක්විති රජු විසින් සිදු කරනු ලබයි. මේ කාලය තුළ අශ්වයා නෑම හා වෙළඹක් සමග සහවාසයෙහි යෙදීම සිදුවන්නේ නැත. එය වැළැක්වීම පසුපසින් යන පිරිසගේ වගකීමක් වේ. පුද පූජා පවත්වා එවූ අශ්වයා අපවිත්‍ර වීම වැලැක්වීම මෙසේ සිදුකිරිමට හේතුවයි. මෙසේ මුදාහළ අශ්වයා යම් හෙයකින් මිය ගියහොත් නැවත එවැනිම අශ්වයෙකු සොයාගෙන නැවතත් පූජාව ආරම්භ කළයුතුය.

අශ්වයා මුළු වර්ෂය පුරාම ඇවිදිමින් යාග භූමිය කරා පැමිණෙන තෙක් යාග මණ්ඩපයෙහි සිටින සියල්ලෝ ම තූර්ය වාදනයෙන්, ගීතිකා කියමින් ප්‍රීතියෙන් කාලය ගත කරති. වසරක් ගෙවීමට දින තුනකට මත්තෙන් අශ්වයා යාග භූමියට කැඳවාගෙන එනු ලබයි. යාගය පැවැත්වීමට දින දොළහකට පෙර සිට මහා යාගය පැවැත්වීම සඳහා සූදානම් වේ. සොයාගන්නා ලද සෝම පැලෑටි[14] තලා යුෂ ගෙන විවිධ චාරිත්‍ර ක්‍රම සිදු කිරීම සඳහා එම දින දොළහෙන් දින තුනක් ගනී. අශ්වමේධ යාගයේ ප්‍රධානතම කාර්යය සිදුවන්නේ අවසන් දින තුනෙන් දෙවෙනි දිනයේ දීය. අනතුරුව අශ්වයා ස්වර්ණ රථයක නංවාගෙන පොකුණක් ලඟට ගෙනගොස් බෙල්ලේ කේසරවල හා වලිගයේ මුතු ඇට එකසිය එකක් එල්ලනු ලැබේ. බොහෝ ලේ වැගිරීම් සහිත හිංසක යාගය සිදු කරන්නේ ඉන්පසුවය. යාගය සඳහා ගනු ලැබූ සතුන් 609 දෙනාගෙන් හීලෑ සතුන් 327 දෙනා පමණක් ඝාතනය කරන අතර කැලෑ සතුන් නැවතත් කැලෑවට මුදා හරින බව කියති.[15] යාගය සඳහා විශේෂයෙන් යොදාගත් අශ්වයා ද සුදු රෙදි කඩකින් පොරවා හුස්ම හිර කොට මරණයට පත් කරයි. මෙහෙසියෝ සියල්ල මැරුණු අශ්වයා ප්‍රදක්ෂිණා කළයුතු අතර අග මෙහෙසිය අශ්වයාගේ මළ සිරුර ළඟ නිදා ගත යුතුය. එසේ නිදා ගන්නා අග මෙහෙසියගේ හා අශ්වයාගේ සිරුරු රෙද්දකින් වසා තබනු ලැබේ. මෙයින් අදහස් කරන ලද්දේ අශ්වයා හා අග මෙහෙසිය සංවාසයේ යෙදී සිටින බවයි. සශ්‍රීකත්වය හෙවත් රටේ ප්‍රජනන ශක්තිය වැඩි දියුණු කිරීම එම සිරිතේ එක් අරමුණක් වූවා විය හැකිය. යාගය පවත්වන රජුගේ පුතෙකු මතු රජකම බලාපොරොත්තු වන්නේ නම් ඒ රජුගේ මෙහෙසිය මළ අසු සමග රැයක් සිටිය යුතු විය. රාම කුමරුගේ මවද මෙසේ සිටි බව රාමායනයේ සඳහන් වේ. ඇතැම් තැනෙක සඳහන් වන්නේ අග මෙහෙසිය නිදා ගන්නේ මළ අශ්වයකු සමග නොවේ. අශ්වයා මරණයට පත් කරනු ලබන්නේ අග මෙහෙසිය උදෑසන අශ්වයා ලඟින් නැගිටීමෙන් පසුවය.

මින්පසු සිදු කරන්නේ රුධිර පූජාව හා මියගිය අශ්වයාගේ හා බිලි දුන් අනිත් සත්වයන්ගේ සිරුරු කැබලිවලට කපා වෙන් කිරීමය. තුන්වෙනි දිනයේදී ''අතිරාත්‍ර'' නම් පූජාව පවත්වා යාගය අවසන් කරයි. යාගය සිදු කරන ලද අවස්ථාවේ යම් වැරැද්දක් සිදු වූයේ නම් ඊට නැවත පූජාවක් පැවැත්විය යුතු විය. ඒ සඳහා යොදා ගනු ලබන්නේ අපරාධකාරයින් හා පවුකාරයින්ය. එහිදී වඳ

එළදෙනුන් විසි එකක් (21) බිලි දී පූජාව පවත්වයි. එය හඳුන්වන්නේ ''අවභෘථ'' යන නමිනි. ඉන්පසු යජමානක විසින් පූජකයන් සතුටු කිරීම සඳහා බොහෝ තෑගි බෝග පිරිනමයි. ඇතැම්විට රජුගේ භාර්යාව ද පූජකයෙකු සමග සංවාසයෙහි යෙදවීමට කටයුතු සිදු කරයි. අධ්වර්යු නම් පූජකයාට යාගය කරන්නාගේ දුව පවරා දිය යුතු අතර, රජුගේ සිව්වෙනි මෙහෙසිය ද ඔහුට හිමි වේ.

මෙවැනි අවසන් ප්‍රතිඵලවලින් පැහැදිලි වන්නේ හුදෙක් රජුගේ ආශ්චර්යය පවත්වාගෙන යාම සඳහා රජු විසින් සියලු දේ කැප කරන බවය. එසේම පූජකයන් විසින් සාදා ගන්නා ලද ක්‍රමවේද ද මීට ඇතුළත් වී ඇති බව සිතිය හැකිය. හුදෙක් ඔවුන්ගේ කාමභෝගි ජීවිතය තෘප්තිමත් කරගනු සඳහා මෙවැනි දෑ යාගය සඳහා ඇතුළත් කරන්නට ඇතැයි සිතිය හැකිය. නැතහොත් එකළ කාන්තාව සම්බන්ධයෙන් දැක් වූ ආකල්පය නිසා උසස් යැයි සම්මත බ්‍රාහ්මණයින් සමග වාසය කිරීමෙන් පාරිශුද්ධත්වය ලැබෙන බව විශ්වාස කරමින් යාගය පවත්වා සියල්ල කැප කරන බව සිතිය හැකිය. මේ සම්බන්ධනේ විවිධ විද්වතුන් මත පළ කර ඇත. ''ඕල්ඩන් බර්ග්'' පවසන්නේ මෙම යාගය හුදෙක් යුදකාමී ආර්යයන් ඉන්ද්‍ර දෙවියාට කරන ලද බිලි පූජාවක් බවය.[16] එසේම මෙම යාගය පැවැත්වීමෙන් අශ්වයාගේ ශක්තිය ඉන්ද්‍රට ද, ඉන්ද්‍රගේ ශක්තිය යාගය කරවන්නාට ද ආරෝපනය කිරීමක් යැයි ''මොරිස් වින්ටර්නීට්ස්'' පවසයි.[17]

**2. පුරුෂමේධ යාගය**

පුරුෂයන් මරණයට පත් කරමින් කරන යාගය මෙනමින් හැඳින්වේ. මේ පිළිබඳ වැඩි විස්තර හමුවන්නේ කෘෂ්ණ යජුර් වේදයට අයත් තෛත්තරීය බ්‍රාහ්මණයේය. එහි එන විස්තරයන්ට අනුව මෙම යාගය පැවැත්වීම සඳහා මිනිසුන් 184 දෙනෙකු අවශ්‍ය වේ. මෙම යාගය සපුරා ගැනීම සඳහා සෑම මිනිස් වර්ගයකට ම අයත් පිරිසෙන් එක් එක් කෙනා බැගින් අවශ්‍ය වේ. විශේෂයෙන් ම බ්‍රාහ්මණ සමාජය විසින් වෙන් කර ඇති සතරාකාර කුලවලට අමතරව ඒ ඒ ගෝත්‍රවලට, ඒ ඒ කටයුතු වෙනුවෙන් හා ඒ ඒ වර්ගවලට අයත්වසිටි පුද්ගලයන් මේ සඳහා තෝරා ගනු ලැබේ. අශ්වමේධ යාගය කරන්නාක් මෙන් මෙම යාගය ද රාජ්‍ය පාලනයෙහි සිටින කෙනෙකුට හැර වෙනත් කෙනෙකුට මෙම යාගය කිරීම අපහසුය. ඒ මන්දයත්? මෙවැනි විවිධ වර්ගයේ මිනිසුන් සොයා ගැනීම සාමාන්‍ය කෙනෙකුට කළ නොහැකි නිසාය. යාගය සඳහා අවශ්‍ය මිනිසුන් 184 දෙනාගෙන් සමහර කෙනෙක් තෝරා ගන්නේ මේ ආකාරයටය.[18]

- පූජකයෙකු වෙනුවට බ්‍රාහ්මණයෙක්
- රජෙකු වෙනුවට ක්‍ෂත්‍රියෙක්
- මරුත් වෙනුවට වෛශ්‍යයෙක්
- තාපස වෘත්තියට ශුද්‍රයෙක්
- තමස් වෙනුවට හොරෙක්
- අපාය වෙනුවට මිනීමරුවෙක්
- පාපයට නපුංසකයෙක්
- කාමයට වෛශ්‍යාවක්
- ශබ්දයට ගායකයෙක්
- නෘත්‍යයට වන්දි භට්ටයෙක්
- ගායනයට නටන්නෙක්
- මරණයට ලෙඩෙක්
- දාදුවට සූදුකාරයෙක්
- නිද්‍රාවට අන්ධයෙක්
- අයුක්තියට බිහිරෙක්

- කාන්තියට ගිනි දල්වන්නෙක්
- යාගයට රජකයෙක්
- තෘෂ්ණාවට රජක ස්ත්‍රියක්
- යම දෙවියා වෙනුවට වඳ ස්ත්‍රියක්
- උත්සවයට නලා කාරයෙක්
- හැඬීමට වස්දඬු පිඹින්නෙක්
- පෘථිවියට පිළු මිනිසෙක්
- අහස වෙනුවට තට්ටය ඇති මිනිසෙක්

මේ ආදි වශයෙන් මිනිසුන් තෝරා ගැනීම සිදුකරනු ලබයි. මෙම තෝරාගත් පිරිස් ඒ ඒ අවශ්‍යතාවන්ට අනුකූල වන පිරිස් වශයෙන් තෝරා ගැනීම විශේෂත්වයක් විය. පුරුෂමේධ යාගය සිදු කරන අය වෙනුවෙන් වෙනම දාන ක්‍රමවේදයක් අතීතයේ පැවති බව බුදුදහම මගින් පෙන්වා දී ඇත. මහත් පුරුෂ බලයක් ඇති අයට සංග්‍රහ කොට ඔවුන් නොයෙක් කාර්යයන්හි යොදවා රටෙහි ආර්ථික සංවර්ධනයට දායක කරවීම එහි අරමුණයි. බමුණන් විසින් ඉදිරිපත් කරන ලද සැහැසි පුරුෂමේධ යාගයට අන් අයුරකට පෙරළා ඉදිරිපත් කිරීම පුරුෂමේධ දානයෙහි අරමුණ විය. ඉහතින් සඳහන් කළ අන්දමට මෙම යාග ක්‍රමය ද වඩාත් අර්ථවත් අන්දමින් අතීතයේ පවත්වා ඇති බව ඉන් අවධාරණය කර තිබේ.

**3. සම්මාපාස යාගය**

මෙහි ''සම්මාපාස'' හෙවත් වියදඬු සිදුරෙහි බහාලන දඬුවක් ඇතට විසි කිරීම පදනම් කරගෙන යාගය සිදුවෙන බැවින් සම්මාපාස යාගය වශයෙන් හඳුන්වනු ලැබේ. එහෙත් ඇතමුන්ගේ මතය වන්නේ ශක්තිමත් ශරීරයක් ඇති පුරුෂයෙකු විසින් දුන්නක් ගෙන ඒ තුළින් විදිනු ලබන ඊතලය යම් තැනක පතිත වන්නේද ඒ තැන යාගය සිදු කරන බැවින් මේ නම යොදා ඇති බවය. ඊතලය වැටුණු තැනට ගැල් උපයෝගී කරගෙන යාගස්ථම්භය වේදිකාවක් මත නංවාගෙන ගෙන ගොස් පිහිටුවයි. ඉන්පසු බමුණන් විසින් ගිතෙල් හා නොයෙක් ධාන්‍ය වර්ග ගින්නට දමමින් මෙම යාගය සිදු කරනු ලැබේ. මෙම යාගයට කිසිම සතෙකු යොදා නො ගැනීම මෙහි ඇති විශේෂත්වයයි. එයින් කිසිවෙකුට හිංසාවක් නො කිරීම ද යාගයේ ඇති වටිනාකමයි. බුදුදහම මෙවැනි අවිහිංසාවාදී යාග ක්‍රම අනුමත කළත් මෙම යාගය සිදු කිරීම අර්ථශූන්‍ය බව පෙන්වා දී තිබේ. සරස්වතී, සරභූ, මහී ආදි ඕනෑම නදියක සිට යාග කිරීමෙන් පිරිසිදු වීම හා ස්වර්ගගාමී වීම සිදුවන්නේ නම් මිනිසුන්ට ප්‍රථම ස්වර්ගගාමී හෝ ශුද්ධිය ලබාගත යුත්තේ එහි සිටින මාළුවන්, කැස්බෑවුන් වැනි ජලජ සත්තුය. එය බුදු රජුන් විසින් ද අවධාරණය කර තිබේ. යාගකාරකයා සරස්වතී නදියේ ගිලෙමින් මෙම යාගය සඳහා සම්බන්ධ වියයුතුය. මීට හේතුවක් ද ඇත. පෙර රජ කෙනෙක් සරස්වතී නදියේ ගිලෙමින් සම්මාපාස යාගය සිදුකිරීම සඳහා සූදානම් විය. නදියේ ඔහු සිටි තැන පොළොව විවර වී රජු එහි ගිලුනේය. ගතානුගතිකත්වයෙන් හා අන්ධ බාල තත්වයෙන් ක්‍රියා කළ බමුණෝ විශ්වාස කළේ රජුගේ ස්වර්ග ගමන මෙකී සරස්වතී නදියේ ගිලුණු තැනින් ආරම්භ වන බවය. ඒ අනුව යඥකාරකයා අනිවාර්යයෙන් ම සරස්වතී නදියේ එම ගිලුණු ස්ථානයේ සිට යාගය සිදු කළ යුතු විය.

මෙම යාගයට ප්‍රතිවිරුද්ධ වශයෙන් දාන ක්‍රමයක් අතීතයේ පැවති බව බුදුදහම පෙන්වා දී තිබේ. එය විග්‍රහ කර ඇත්තේ ''සම්මා'' යනු ''මනා'' යන්නයි. ''පාස'' යනු බැඳීමයි. එනම් ''සිත මනාකොට බැඳීමයි.'' යම් කෙනෙකුට උදව්වක්, උපකාරයක් කළ පසු එම පුද්ගලයා එකී උදව්ව කළ පුද්ගලයා කෙරෙහි බැඳීමක් ඇතිකර ගනී. අසරණ බොහෝ මිනිසුන්ට කිසිදු ලියවිල්ලක් හෝ පොලියක් නොමැතිව මුදල් දහස් ගණන් දී ඔවුන්ට ජීවන මාර්ගයක් සකසා දී ඔවුන්ගේ සහයෝගයෙන් කටයුතු සිදු

කිරීමට හැකිනම් එය සම්මාපාස දානයයි. සැබවින් ම පුද්ගලයෙකුට උදව්වක් කළ විට එම පුද්ගලයා එය මතකයේ තබාගෙන උදව්ව කළ පුද්ගලයාට නැවත උදව්වක් කිරීමට අවස්ථාවක් ලැබුණහොත් ඔහුට අනිවාර්යෙන් ම එකී උදව්ව සිදු කරනු ලබයි. මේ ආකාරයෙන් අන්‍යෝන්‍ය වශයෙන් ඇති කරගන්නා විශ්වාසය හා ප්‍රසාදය තුළින් සිදුවන්නේ මනා බැඳීමකි. එයම ''සම්මාපාස'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

**4. වාජපෙය්‍ය යාගය**

'වාජ' හෙවත් මන්ත්‍ර පද කියා සකස් කර ගන්නා ලද ගිතෙල් හා මී පැණි පානය කරමින් කරනු ලබන යාගය ''වාජපෙය්‍ය'' යාගය වශයෙන් හඳුන්වනු ලැබේ. මෙම යාගය පැවැත්වීමේ දී පරිවාර වශයෙන් තවත් යාගයක් සිදු කරනු ලබයි. එනම්:- සිවුපාවුන් දහහත් දෙනෙකු යාගස්ථම්භය කරා ගෙන ගොස් බිලි පූජා පවත්වමින් කරනු ලබන යාගයයි. මෙහි යාගස්ථම්භය සාදා ගැනීම සඳහා යොදා ගනු ලබන්නේ බෙලි ගසකින් කපා ගන්නා ලද දණ්ඩකි. මෙම යාගය සිදුකිරීම පිළිබඳ මෙකී තොරතුරු හමුවන්නේ සංයුත්ත නිකායට්ඨකථාවේය.[19] එහි පෙන්වා දෙන අන්දමට අතීතයේ ''වාචපෙය්‍ය'' වශයෙන් දානයක් පවත්වා ඇත. එහි විශේෂත්වය වන්නේ මිනිසුන්ට ආමන්ත්‍රණය කිරීමේදී ''පියාණෙනි, මෑණියනි, මයිලනුවනි, නැගණියනි ආදි වශයෙන් කථා කරන ලද ප්‍රියවචනයන්ය. මෙය ඔවුන්ට දෙනු ලබන දානයක් වශයෙන් හඳුන්වා ඇත. එහෙත් පසුකාලීන බ්‍රාහ්මණයින් විසින් මෙහි නම වෙනස් කොට ''වාජපෙය්‍ය'' වශයෙන් දක්වා යාගයක් පැවැත්වූ බව මූලාශ්‍රවලින් පැහැදිලි වේ.

**5 නිරග්ගල යාගය**

මිනිසුන් හා සතුන් විශාල වශයෙන් යොදවාගෙන හා නොයෙක් ධාන්‍ය වර්ග ගින්නට දමමින් බිලි පූජා වශයෙන් පවත්වනු ලබන යාගය ''නිරග්ගල යාගය'' යනුවෙන් හඳුන්වනු ලැබේ. ඇතමුන් මෙය ''සර්වමේධ'' යාගයට ම හඳුන්වන පර්යාය වචනයක් වශයෙන් හැඳින්වුවත් සර්වමේධ යාගයෙහි මෙන් සියල්ල කැපකොට මෙම යාගය සිදු නොකරනු ලබයි. මෙහි සියල්ල වශයෙන් හඳුන්වනු ලබන්නේ මිනිසුන් සතුන්, ගිතෙල්, මී පැණි, ධාන්‍ය වර්ග ආදිය පමණක් නොව අශ්වමේධ වැනි යාගවලදී තම භාර්යාව ද, දියණිය ද, කැපකොට කරනු ලබන යාග ක්‍රම සඳහා යොදා ගන්නා දෑය. එහෙත් නිරග්ගල යාගය පැවැත්වීම සඳහා යොදා ගැනෙන්නේ ඉහතින් සඳහන් කළ කළමනා පමණි. ඉහතින් සඳහන් කළ අන්දමට මුල් කාලයේ පැවති සස්සමේධ, පුරිසමේධ, සම්මාපාස, වාචපෙය්‍ය ආදි යහපත් දානයන් මෙන් නිරග්ගල යනුවෙන් දාන වර්ගයක් ද අතීතයේ පැවති බව බුදුරජුන් විසින් දේශනා කර තිබේ. එය ද ජනයාගේ සිත් සතුටු කරවන අන්දමේ දානයක් විය. එහෙත් බ්‍රාහ්මණයින් විසින් අනෙකුත් යාගයන් මෙන් ම මෙම යාග ක්‍රමය ද අප්‍රමාණ සතුන් හා මිනිසුන් යොදා ගනිමින් හිංසාකාරී අන්දමින් පැවැත්වීම සඳහා යොදාගත් බව පෙනේ. මේ සියල්ල සිදුකරන ලද්දේ දෙවියන් කෙරෙහි පැවති භක්තියත්, දෙවියන්ගෙන් දඬුවම් ලැබෙය යන භීතියත් හේතු කොටගෙනය. අශ්වමේධ යාගය පවත්වන්නාක් මෙන් පූජකයා යාග කාරකයාගේ සියලු වස්තූන් මෙන් ම භාර්යාවන් ද අයිති කර ගනිමින් මෙම යාගය සිදු කරයි. යාග කාරකයා විසින් ස්වර්ගාපේක්ෂාවෙන් හා සම්පත් ලැබීමේ අපේක්ෂාවෙන් ඒ සියල්ල කැප කොට යාගය සිදු කරනු ලබයි.

මේ යාග ක්‍රමය ද ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ පෙර පැවති දාන ක්‍රමය පිළිගෙන ඇත. එවැනි දාන ක්‍රමයක් පැවති නිසා මිනිසුන්ට කිසිදු ගැටළුවක් නොවුන බවත් තම සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා තමන්ගේ ගෙවල් දොරවල් වසා තැබීම නොකළ බවත් පෙන්වා දී ඇත. එසේ වූයේ කිසිවෙක් අන් අයගේ ගෙවල් දොරවල් හා අගුලු බිඳ සොරකම් නොකළ නිසාය. දොර අගුලු නොදමා තිබූ බැවින් එය ''නිරග්ගල'' වශයෙන් හඳුන්වා ඇත.

මේ ආකාරයට ඉහතින් සඳහන් කළ යාග ක්‍රම පහක් පිළිබඳ තොරතුරු සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ යඤ්ඤ සූත්‍රය මගින් පෙන්වා දී ඇත. මෙවැනි යාග ක්‍රම පහක් තත්කාලීන

සමාජයේ දක්නට ලැබුණත් එවැනි මහායාග පැවැත්වීමෙන් මහත් ආනිශංසයක් ලබා ගත නොහැකි බව අවධාරණය කරයි.[20] එසේ නොවීමට හේතු වශයෙන් දක්වා ඇත්තේ යම්කිසි යාගයක එළු, බැටළු, ගව ආදි නොයෙක් සතුන් බිලිදෙමින් කරන යාගය මහර්ෂීන් විසින් අනුමත නොකරන නිසාය. ඉහතින් සඳහන් කළ අන්දමට සතුන්, මිනිසුන් ආදීන් බිලි නොදෙමින් කරන්නා වූ යම් යාගයක් තිබේ නම් එවැනි යාග උතුම් බවත් බුදුවරුන් වැනි මහර්ෂීහු එවැනි යාග කරා පැමිණ ඒවා අනුමත කරන බව ද අවධාරණය කර ඇත. සතුන් මිනිසුන් බිලි දෙමින් කරන යාගයෙන් කෙනෙකුට සිදුවන්නේ අයහපතකි. එහෙත් එවැනි හිංසා පීඩාකාරී ක්‍රියාවන්ගෙන් අත්මිදී කරන්නා වූ යාගයෙන් යහපතක් සිදු වේ. එවැනි යාග ක්‍රම බුදුරජුන් විසින් ද අනුදැන වදාරා ඇත. ඒ අනුව බුදුදහමේ යාග ක්‍රම දෙකකි. ''මහණෙනි මේ යාග ක්‍රම දෙකක් ඇත. ඒ කවරේද යත්? ආමිස යාගය හා ධර්ම යාගයයි.'' (ද්වේ මෙ භික්ඛවෙ යාගා. කතමා ද්වේ? ආමිස යාගා ධම්ම යාගා)[21] මෙම යාග හෙවත් දාන පැවැත්වීමේදී ''සහල් ද, යහන් ද, වස්ත්‍ර ද, ගිතෙල් ද, තල තෙල් ද දැහැමින් එකතු කොට පූජා කරනු ලබයි. එවැනි දානවල දී ගවයන් ඝාතනය නොකළහ.''[22] (තණ්ඩුලං සයනං වත්ථං සප්පිතෙලඤ්ච යාචිය ධම්මෙන සමොධානෙත්වා තතො යඤ්ඤ මකප්පයුං) උපට්ඨිතස්මිං යඤ්ඤස්මිං නාස්සුගාවො හනිංසුතෙ) යනුවෙන් දක්වා තිබේ. මෙවැනි යාග ක්‍රම බුදුරජුන් විසින් අනුමත කොට ඇත. එවැනි යාග පැවැත්වෙන ස්ථානවලට එවැනි මහර්ෂීහූ පැමිණෙන බවත් ඒවා මහත්ඵල මහානිශංසය වන බවත් පෙන්වා දී තිබේ.

ආන්තික සටහන්

---

1 ඍග්වේද, x 85.

2 ඍග්වේද, i 66.

3 ඍග්වේද, v 63.

4 දීඝනිකාය, සීලක්ඛන්ධ වග්ග, කූටදන්ත සුත්තං, බු. ජ. මු. 2006, 248 පිටුව

5 සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, කූටදන්ත සුත්ත වණ්ණනා, හේ. වි. මු. 1969, 114 පිටුව.

6 සංස්කෘත සාහිත්‍යය, ජී. එස්. බී. සේනානායක, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1960, 5 පිටුව.

7 මේධානන්ද හිමි, දේවාලේගම, බෞද්ධ අධ්‍යයන ප්‍රවේශය, නිව් දීපා මුද්‍රණාලය, කැළණිය, 1997, 15, 16 පිටු.

8 සාරත්තප්පකාසිනි නාම සංයුත්තනිකායට්ඨකථා, 311 පිටුව.

9 මූර්ති, ආගම හා මියගිය ලෝකය, මයුර පොත් ප්‍රකාශකයෝ, 2009, 101 පිටුව.

10 -එම- 101 පිටුව.

11 සාරත්තප්පකාසිනි නාම සංයුත්තනිකායට්ඨකථා, 311 පිටුව.

12 -එම- 101 පිටුව.

13 මෙම කුමාරවරු බොහෝ සෙයින් මෙහෙසියන්ගේ පරිවාර ස්ත්‍රීන්ට සම්බන්ධ උසස් පෙළපත්වලින් තෝරාගනු ලබන තරුණයින් පිරිසක් වන්නාහ. මොවුහු තම තමන්ගේ තරාතිරම් අනුව සන්නාහ සන්නද්ධ වී කඩු හෝ. ඊතල හෝ පොලු රැගෙන යති.

14 යාගය සිදු කරන අවස්ථාවේ සෝම පානය කරන බව කියවේ. මුල්කාලයේ සෝම යනුවෙන් හඳුන්වා ඇත්තේ පැලෑටි විශේෂයකි. මෙයින් පෙරා ගන්නා ලද බීම වර්ගය වෛදිකයන් අතර විශේෂ සැලකිල්ලට භාජනය විය. එය පානය කරන

ලද්දේ යාග හෝම පවත්වන දිනවලදීය. ආදි ජනතාව මෙන්ම වෛදිකයෝ ද සෝම පැලෑටිවල වර්ධනයත්, චන්ද්‍රයාත් අතර සම්බන්ධතාවක් ඇතැයි සැලකූහ. මෙසේ පැලෑටියක් වශයෙන් පිළිගත් සෝම පසුකලෙක සඳ දෙවියා හා සම්බන්ධ කරන ලදි. මේ අනුව චන්ද්‍රයා ද සෝම ද එකම දෙවියෙක් විය. ඍග්වේදයෙහි නවවෙනි මණ්ඩලය වෙන්වී ඇත්තේ සෝම දෙවියන් වෙනුවෙනි. එහි ඇතැම්විට සෝම යනුවෙන් හඳුන්වා ඇත්තේ ඉන්ද්‍රගේ ආත්මය සහ උපදේශකයා වශයෙනි. සෝම ඉන්ද්‍රගේ වජ්‍රය ලෙස ද දක්වා තිබේ. ගීතිකාවල උත්පාදකයා ද කවීන්ගේ බප්‍රදානයා ද තවුසන්ගේ ඍෂිවරයා ද මේ මද්‍යකාරක සෝමය.

මූර්ති, ආගම හා මියගිය ලෝකය, මයුර පොත් ප්‍රකාශකයෝ, 2009, 101 පිටුව.

[15] නන්ද හිමි, බළන්ගොඩ, උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය, සරාජී ප්‍රකාශන, 1997, 244 පිටුව.

[16] මූර්ති, ආගම හා මියගිය ලෝකය, මයුර පොත් ප්‍රකාශකයෝ, 2009, 101 පිටුව.

[17] Winternitz, M. History of Indian Literature, Vol, 1, 1927, p. 115.

[18] නන්ද හිමි, බළන්ගොඩ, උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය, සරාජී ප්‍රකාශන, 1997, 250 පිටුව.

[19] සාරත්තප්පකාසිනි නාම සංයුත්තනිකායට්ඨකථා, 311 පිටුව.

[20] සංයුත්ත නිකාය, කෝසල සංයුත්තය, යඤ්ඤ සූත්‍රය, බු. ජ. මු., 2005, 144 පිටුව.

[21] අංගුත්තර නිකාය, දුක නිපාතය, බු. ජ. මු. 2005, 178 පිටුව

[22] සුත්තනිපාතය, බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය, බු. ජ. මු. 2005, 268 පිටුව.